

# පහන වෙද ගෙදර විශේෂාංගය

## වාත රක්තය

කෂාය කටුක තික්ත සැහැල්ලු, වියලි ප්‍රමිතාහාර පාන හේතුවෙන් ඉතාම වැඩුණ වාතය ලුණු ඇඹුල්, තියුණ උෂ්ණ විරුද්ධ ආහාර, උෂ්ණකාල ආදිය වැඩි වැඩියෙන් භාවිතා කරීම හේතුවෙන් රුධිරය ගමන් කරන ධමනි මාර්ගයන් අවුරා කිපුන වාතය ලේ ධාතුව දූෂණය කිරීමෙන් උපන් රෝගය වාතරක්තය ලෙස හඳුන්වයි.

දෑත, දෙපා, ඇඟිලි සියලු සන්ධීන් රක්තයේ ප්‍රධාන ස්ථාන වෙත වාත රක්තයේ ගිනි ගුණය හා වාතයමිශ්‍රව සමව පවත්නා බව ආයුර්වේදයේ මතය වී ඇත. සමපිට වැළඳුණ වාත රක්තයට (උත්තාන වාත රක්තය) බෙහෙත් තෙල් ගල්වා සම්බානය කිරීම, මදක් උණුසුම් ආලේප බොහෝ සේ ගෑම කළ යුතුය.

ගම්භීර වාත රක්තයේ විරේකය වස්ති කිරීමය. වාත රක්තයට හිතැති තෙල් පානය කිරීම ද කළ යුතු වේ. උත්තාන හා ගම්භීර වාත රක්තයන් දෙකෙහිම රුධිරය පිට කිරීම (කූඩැල්ලන් මගින්) රක්ත මෝක්‍ෂා අං, ඉදිකටු, ලබු, කබල් ඒ සඳහා පෙර වෙදැදුරන් ප්‍රයෝජනයට ගත්හ. (ඉහත සඳහන් කළේ සුශ්‍රැත සහ චරක ආචාර්යවරුන්ගේ මතයන්ය.

මුත්‍රාවල ඇති වන යූරික් ඇසිඩ් හෙවත් ලයිනික් ඇසිඩ් හේතුවෙන් රුධිරය සහ සූක්ෂම ග්‍රන්ථීන් දූෂණය කරන වාත රක්තය අතිශය වේදනාකාරී වූ ද පීඩාකාරී වූ ද රෝගයකි. යූරික් ඇසිඩ් හටගැනීමට ප්‍රධානම හේතුව වන්නේ අධිකව ආහාර ගැනීම, මිහිරි පානීය වර්ග හා මත්පැන් ගැනීමයි. මේ හේතුවෙන් අක්මාවේ හෝ වකුගඩුවල ක්‍රියාකාරිත්වයේ වෙනස්කම් ඇතිකරයි.

වාත රක්තය සහජයෙන්ද ඊයම් විෂ වීමෙන් ද හටගන්නා බවත් වාත රක්තය සහ ආම වාතයට බොහෝ විට සමාන බවත් පෙනේ. වාත රක්තය හටගන්නේ කුඩා සන්ධිවලිනි. ව්‍යායාම්වල නොයෙදෙන අලස සුබෝපභෝගී අයට හටගනී. වයසින් වැඩි අයට වාත රක්තය උරුම වී ඇත. රාත්‍රී කාලයේ උපදින වාත රක්තය ශරීරයේ එක් තැනක් පොඩි කරන්නාක් මෙන් දැනෙන අතිශය දරුණු වේදනාවක් ආරම්බයේ දී ම ඇතිවෙයි. වැඩි වශයෙන් මෙම වේදනාව හටගන්නේ පාදයක මාපටැඟිල්ලෙනි. මෙය GOUT ලෙස හඳුන්වයි. එම වේදනාව උදය කාලය වනවිට අඩුවන නමුත් ඇඟිල්ල ඉදිමුණ මොලොක් දිලිසෙන රක්ත වර්ණයෙන් යුක්තය. අම්ල හා උෂ්ණ ගතියෙන් යුත් දහඩිය පිට කරයි. රෝගයේ මුල් කාලය මුත්‍රා බහුලව පිට වන අතර එම මුත්‍රාවල ගඩොල් කුඩු වැනි මණ්ඩි ගතියක් දැකිය හැකිය.

රාත්‍රී කීපයක් වේදනාව ඇති වී ආබාදිත ස්ථානයේ ඉදිමුම වැඩි වන විට වේදනාව අඩුවීමට පටන් ගනී. වේදනාවත්, ඉදිමුමත් දෙකම අඩුවන විට ආබාධිත ස්ථානයේ හම ක්‍රමානුකූලව ගැලවී යයි. මාස කීපයකට පසු නැවත එම ආබාදය වරින් වර ඇති වීම නිසා ශරීරයේ වණ තුවාල හටගනී. මුත්‍රාවල ලේ වල සීනි තාබේ නම් ප්‍රවේසම් සහිත පීවිතයක් ගත කලත්, වණ තුවාල දුරදිග යාමෙන් ආබාධිත තත්වයට පත්විය හැකිය.

අතේ ඇඟිලිවල ද ආමාශයේ ද අභ්‍යන්තරිකව වෙනත් ස්ථානයක ද මෙම රෝගය හට ගැනීමට ඉඩ ඇත. එමනිසාම කරකැවිල්ල කෘශජාන්‍ය, ඇදුම, ඇස් රෝග, මොළේ ආබාධ, කන්වල ආබාධ සුව නොවී පවත්නා චර්ම රෝග ද ඇති කරයි. මුත්‍රා ලේ පරීක්ෂාව ආහාරවලින් ප්‍රවේසම් වීම අනිවාර්යය වේ.

වාත රක්තය සඳහා දේශීය ප්‍රතිකාර ගැනීමේ දී ආයුර්වේද වෛද්‍යවරයා හමුවී නාඩි පරීක්ෂා කරගැනීමෙන් පසුව බෙහෙත් ගැනීම යහපති.

1. දුම්මැල්ල, කටු කරෝසන, හාතවාරිය අල, තිපල්, රසකිඳ කෂාය මගින් දැවිල්ල, වාත රක්තය සුව කරයි. මෙම ක්වාථය තවත් රෝග කීපයකටම ගුණදායකය. (පටෝල කටුකාදිය ක්වාථ)
2. බෝ පොතු කෂාය, මී පැනි ප්‍රතිවාප කොට බොන්න. දරුණු වූ තුන්දොසින් උපන් වාත රක්තයට ගුණ වේ
3. වැල්මදට, තිපල්, කොහොඹ පොතු, වද කහ, කටු රෝසන, රසකිඳ, වෙනිවැල්ගැට කෂාය බොන්න. (නවකර්ෂ ක්වාත)

පංච කර්ම චිකිත්සාව ඉතා වැදගත් වේ. බෙහෙත් තෙල් ගල්වා හිස සිට දෙපතුල දක්වා සම්භානය, විරේකය හා කටී වසිති කිරීම විශේෂ වේ.

**සෑම් දසනායක - ආයුර්වේද වෛද්‍යය**
පංච කර්ම විශේෂ - Kerala India
මාලේවන ශ්‍රී ඤාණිස්සර ආයුවේද වෛද්‍ය ශාස්ත්‍රී (ශ්‍රී ලංකා)
(BS Biology-USA) (GDip-Ayurvedic Panchakarma Therapy-India)

**ආයුර්වේද වෛද්‍ය හා ජ්‍යොතිෂ මධ්‍යස්ථානය**

**සර්වාංග වෛද්‍ය ප්‍රතිකාර සහ සියලු පංචකර්ම ප්‍රතිකාර**

- Rheumatoid Arthritis, Osteoporosis ආම වාත ඇතුළු සියළුම සන්දි ගත රෝග නිට්ටාවටම සුවකිරීම
- Psoriaisis, Eczema පොතු කබර, සුදු කබර ඇතුළු සියළුම චර්ම රෝග සඳහා
- Sinusitis, Rhino Sinusitis සෙම පීනස ඇතුළු සියළුම සෙම් රෝග සඳහා
- Cervical Spondylosis, Bulge Disk, Slip Disk ඇතුළු සියළුම කොඳුනාරටියේ දුර්වලතා
- Stress, Insomnia, Dementia ආතතිය ඇතුළු සියළුම මානසික දුර්වල සඳහා
- Irritable bowel syndrome උදර හා ආමාශගත සියලු රෝග
- Epilepsy මී මැසි මොරය
- Kidney stones and Nephritis මුත්‍රාශයේ ගල් සහ මුත්‍ර අමාරු සඳහා
- Balding and loosing hair අකලට හිස කෙස් පැහීම සහ තට්ටය පෑදීම
- Erectile dysfunction ලිංගික අප්‍රානික තාවය
- Hemiplegia and Paraplegia පක්ෂගාතය
- Gastritis and Hyper-acidity අම්ල පිත්තය සහ රක්තපිත
- Haemorrhoids අර්ශස්

**දියවැඩියාව**
**හෙවත් මධුමේහය ප්‍රද්‍රාව**
**DIABETES MELLITUS**
**පුරාණ බෙහෙත් වට්ටෝරුවක දුර්ලබ ගනයේ ශාකසාරයෙන් හා හෙල වෙදකමේ ඇති අනෙකුත් ප්‍රත්‍යක්ෂ ආයුර්වේද බෙහෙත් වලින් දියවැඩියාව සඳහාම සාදන ලද ප්‍රත්‍යක්ෂ ආයුර්වේද බෙහෙත්.**

ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර සහ පරීක්ෂණ සඳහා
ආයුර්වේද වෛද්‍ය
**සෑම් දසනායක**
මාලේවන ශ්‍රී ඤාණිස්සර ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රී (ශ්‍රී ලංකා)
(BS Biology-USA) (GDip-Ayurvedic Panchakarma Therapy-India)



SAHANRO AYURVEDIC
WELLNESS CENTRE
Arogya Parama laba
(Highest wealth is Health)

සියලුම විමසීම්
දුරකථනඃ 61 3 9886 6460
ජංගමඃ 0421 793 844
392 Blackburn Road,
East Burwood VIC 3151
E mail: sam@sahanro.com.au
www sahanro com au